# බළන්ගොඩ නගර සභාව

## 2023-02-23 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2023.02.23**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනී | ජී.චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | එම්.ජී. ශාන්තිලේඛා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රීනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | ඩී.එම්.ජේ.යූ ධර්මරත්න මයා |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලද අතර, විශේෂ යෝජනා කිහිපයක් වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම සඳහා මෙදින විශේෂ මහ සභාව පවත්වන බව පවසන ලදී.

**පෙ.ව 10.04 ට පමණ ගරු නාගරික මන්ත්‍රීනී එම්. ශාන්තිලේඛා මැතිතුමිය සභාවට පැමිණෙන ලදී.**

1. F.M දෙරණ Attack show ප්‍රසංගය 2023 මාර්තු මස 24 වන දින පැවැත්වීම සඳහා මහජන ක්‍රීඩාංගනය ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ඇති වූ සාකච්ඡාවෙන් පසුව F.M දෙරණ Attack show ප්‍රසංගය 2023 මාර්තු මස 24 වන දින පැවැත්වීම සඳහා මහජන ක්‍රීඩාංගනය ලබා නොදීමට තීරණය කළ අතර, ඒ අනුව මෙම යෝජනාව ප්‍රතික්ෂේප විය.

2. කොමර්ෂල් හංදියේ සවිකර ඇති සෙලින්කෝ ලයිෆ් හි LED පුවරුවේ ගාස්තු අය කිරීම පිළිබඳව සාකච්ඡා කර, ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් සෙලින්කෝ ආයතනය මඟින් 2021 වර්ෂයේ දී කොමර්ෂල් හංදිය අසල (වත්මන් ASB වෙළඳ ආයතනය ඉදිරිපිට) සවි කර ඇති විද්‍යුත් ප්‍රචාරක පුවරුව වර්ග අඩි 228 කින් යුක්ත වන අතර ඒ සඳහා ප්‍රදර්ශන ගාස්තු අය කිරීමේ දී එවකට ගරු සභාපතිතුමන්ගේ සටහනක් අනුව වාර්ෂිකව වර්ග අඩියකට රු.200.00 බැගින් ගාස්තු අය කරන ලෙස දන්වා ඇති බවද 2021 සහ 2022 වර්ෂයන්හි ගැසට් පත්‍ර අනුව රුපියල් දෙලක්ෂ දහ අට දහස් අටසිය අසූවක මුදලක් සභාව වෙත අය කර ගැනීමට තිබූ නමුත් අය කර ඇත්තේ වාර්ෂිකව රු.45,600.00 ක් බවද පවසන ලදී.

එමෙන්ම 2023 වර්ෂයට අදාල ගැසට් පත්‍රය අනුව විද්‍යුත් ප්‍රචාරක පුවරුවක් වර්ග අඩියක් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් මාසිකව රු.200.00 ක මුදලක් අය කළ යුතු බව දක්වා ඇති අතර, වර්ග අඩි 228 කින් යුක්ත විද්‍යුත් ප්‍රචාරක පුවරුව වෙනුවෙන් 2023-07-14 දින සිට 2024-07-13 දින දක්වා වූ කාලය සඳහා අය කළ යුතු මුළු මුදල රු.547,200.00 ක් වන බවද මේ සම්බන්ධව සභාව විසින් සාකච්ඡා කර තීරණයක් ගත යුතු බවද ගරු සභාපතිතුමා වැඩිදුරටත් පවසන ලදී.

මේ සම්බන්ධව 2023-02-14 දිනැති මහ සභාවේ දී ලබා ගත් තීරණය පරිදි 2023-02-22 දින සෙලින්කෝ ආයතනයෙහි කළමනාකරු සමඟ සාකච්ඡා කළ අතර, එහිදී,

- මෙම විද්‍යුත් ප්‍රචාරක පුවරුව සෙලින්කෝ ජෙනරල් ඉෂුවරන්ස් ලිමිටඩ් ආයතනයේ ප්‍රධාන ශාඛාවේ පූර්ණ අධීක්ෂණය යටතේ පවත්වා ගෙන යන අතර, පුවරුවේ ප්‍රදර්ශනය කරනු ලබන්නේ එම ආයතනයේ දැන්වීම් පමණක් බවද
- මෙවැනි විද්‍යුත් ප්‍රචාරක පුවරු ඉතා විශාල ප්‍රමාණයක් නාගරික ප්‍රදේශ ආශ්‍රිතව පවත්වා ගෙන යනු ලබන අතර, ඒ සඳහා අදාල අධිකාරීන් වෙත ගෙවනු ලබන්නේ බළන්ගොඩ නගර සභාවට සිදු කරන ගෙවීම්වලට ආසන්න අගයක් බවද

සඳහන් කළ අතර, විදුලි බිල් අධිකව වැඩි වීම හා පවතින තත්ත්වය අනුව රුපියල් ලක්ෂයකට අඩු සාධාරණ බදු වැඩිකිරීමක් සිදු කරන ලෙස ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ මෙහි සෙලින්කෝ වෙළඳ දැන්වීම්වලට අමතරව නගර සභාවේ යම් යම් සේවාවන් මෙන්ම බළන්ගොඩ ප්‍රදේශයේ විශේෂිත වැඩසටහන් සම්බන්ධව වීඩියෝ පට ප්‍රචාරය කිරීමට අවස්ථාව සලසා ගැනීම පිළිබඳව අවධානය යොමු කිරීම සුදුසු බවයි.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් මෙම විද්‍යුත් පුවරුව මඟින් නගරයට අලංකාරයක් එක්වන බැවින් නගරය පුරා මෙවැනි දෑ ව්‍යාප්ත කිරීමට අවස්ථාවන් සලසා දිය යුතු අතර, බස්නැවතුම්පළ විද්‍යුත් පුවරුව සිදු කළ අය සමඟ ද සාකච්ඡා කරන ලෙස පවසන ලදී.

ඒ අනුව කොමර්ෂල් හංදියේ සවිකර ඇති සෙලින්කෝ ලයිෆ් හි LED පුවරුවේ ගාස්තු අය කිරීමේ දී 2023-07-14 දින සිට 2024-07-13 දින දක්වා වූ කාලය සඳහා රුපියල් ලක්ෂයක (රු. 100,000.00) මුදලක් ගාස්තු වශයෙන් අය කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

3. බස්නැවතුම්පල පදික කඩ පිටුපසින් ඉදි කළ පැති බැම්ම නිසා ඇති වූ ඉඩ ප්‍රමාණය සඳහා වහලක් ඉදි කිරීම සම්බන්ධව සාකච්ඡා කර, ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

බස්නැවතුම්පල පදික කඩ පිටුපසින් ගලා එන ජලය කඩ තුලට කාන්දු වීම නවතා ගැනීම සඳහා කඩ පිටුපසින් පැති බැම්මක් ඉදි කළ අතර, ඒ සඳහා සභාව වෙත ස්තුතිය පළ කරන බවත්, පැති බැම්ම ඉදි කිරීමෙන් පසු යම් ඉඩ ප්‍රමාණයක් ඉතිරි වූ නිසා එම කොටස තුල ජලය හා අපද්‍රව්‍ය එකතු වී මදුරුවන් බෝවිය හැකි බැවින් එම ඉඩ ප්‍රමාණය තුල වහලක් ඉදි කිරීමට අවසර ලබා දෙන ලෙසත් වැඩිවන බිම් ප්‍රමාණයට බිම් කුලිය වැඩි කර අය කරගෙන ව්‍යාපාරිකයන් සඳහා එම ඉඩ ප්‍රමාණය ලබා දෙන ලෙසත් ඉල්ලමින් බළන්ගොඩ, පදික කඩ හිමියන්ගේ වෙළඳ සංගමය විසින් 2023-02-14 දිනැති මහ සභාවේ පැමිණිලි හා සංදේශ යටතේ ලිපියක් ඉදිරිපත් කර තිබූ බව ගරු සභාපතිතුමා පවසන ලදී.

මේ සම්බන්ධව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, මෙම ස්ථානයේ බැම්ම ඉදිකරන විට විශාල ගලක් දිගටම විහිදී ගොස් තිබූ අතර, කාණුව ඉදි කිරීමේ ගැටලුවක් පැවති බව ද එම නිසා අඩි 02 ක පමණ හිඩැසක් ඇති වූ බව ද එම ඉඩමෙන් ප්‍රයෝජනයක් නොමැති නමුත් සොරකම් ආදිය සිදු කිරීමේ අවදානමක් පවතින බවද මේ නිසා ඉල්ලීමේ සාධාරණයක් පවතින බවද පැවසීය.

ඒ අනුව බස්නැවතුම්පල පදික කඩ පිටුපසින් ඉදි කළ පැති බැම්ම නිසා ඇති වූ ඉඩ ප්‍රමාණය සඳහා වහලක් ඉදි කිරීමට අවසර ලබා දීමටත් වහලය ඉදි කිරීමෙන් පසුව තක්සේරු වාර්තාව ලැබෙන තෙක් කඩ කුලී වශයෙන් මාසිකව රු.3,000.00 ක මුදලක් 2023-04-01 දින සිට අය කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

4. ගබඩාව සතුව පවතින ටයර් නැවත පිරවීම (ඩැග් කිරීම)වෙනුවෙන් සුදුසු ඩැග් වර්ගය තෝරා ගැනීම සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව සලකා බැලීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගබඩාව සතුව පවතින ටයර් නැවත පිරවීම (ඩැග් කිරීම)වෙනුවෙන් ඉදිරිපත් කර ඇති මිල ගණන් අනුව ජයන්ති ටයර් සෙන්ටර් වෙතින් ඉදිරිපත් කර ඇති මිල ගණන්හි ඩැග් කරන ලද ටයරයේ කට්ට නැවත ගෙවී යන තුරු ඩැග් එක සඳහා වගකීම ලබා දෙන බවට සඳහන් කර ඇති බැවින් හා අනෙකුත් ආයතන විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන්හි එවැනි වගකීමක් සඳහන් කර නොමැති බැවින් එම ආයතනයෙන් ටයර් ඩැග් කිරීම සිදු කිරීමට සුදුසු බව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

ඒ අනුව ටයර් ඩැග් කිරීමේ දී ජයන්ති ටයර් සෙන්ටර් වෙතින් ටයර් ඩැග් කිරීම හා සේවාව ලබා ගැනීමෙන් පසු මුදල් ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

| ටයර් ප්‍රමාණය | අවශ්‍ය ටයර් ප්‍රමාණය | ඒකක මුදල |
|---|---|---|
| 700 × 16 ටයර් | 07 | රු. 11,900.00 |
| 700 × 15 ටයර් | 01 | රු. 11,500.00 |
| 650 ×16 ටයර් | 02 | රු. 11,800.00 |
| 600 × 16 ටයර් | 01 | රු. 9,800.00 |

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 10.16 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

ඩබ්.ඒ වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.